ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

<u>පශ්චාත් දිට්වා නැවත ඉදිකිරීම් සඳහා වන ඉන්දීය **ආධාර** පැකේජය යටතේ පළමු බේලි පාලම විවෘත කරේ</u>

ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා, ප්‍රවාහන සහ මහා මාර්ග නියෝජ්‍ය අමාත්‍ය ගරු වෛද්‍ය ප්‍රසන්න ගුණසේන මහතා සහ අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය ගරු වෛද්‍ය මධුර සෙනෙවිරත්න මහතා විසින් 2026 දෙසැම්බර් 10 වන දින අඩි 100ක දිගින් යුත් බේලි පාලමක් විවෘත කරන ලදී. පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රංජිත් විජයරත්න මහතා ද මෙම අවස්ථාවට සහභාගී විය. ශ්‍රී ලංකාවේ මධ්‍යම සහ ඌව පළාත් අතර අත්‍යවශ්‍ය මාර්ග සම්බන්ධතාවයක් ප්‍රතිෂ්ඨාපනය කරමින් ඉන්දීය යුධ හමුදාවේ 19 ඉංජිනේරු රෙජිමේන්තුව විසින් මහනුවර-රාගල B-492 මහා මාර්ගයේ මෙම පාලම ස්ථාපනය කරන ලදී. මෙම ව්‍යාපෘතිය පශ්චාත් දිට්වා නැවත ඉදිකිරීම් සඳහා වන ඇමරිකානු ඩොලර් මිලියන 450ක ඉන්දීය ආධාර පැකේජය යටතේ ව්‍යපෘතීන් ක්‍රියාත්මක කිරීම සනිටුහන් කළේය. ඉන්දීය විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මහතා විසින් 2025 දෙසැම්බර් 22-23 දිනවල සිදු කළ ශ්‍රී ලංකා සංචාරය අතරතුර දී මෙම පැකේජය ලබා දෙන බව නිවේදනය කළ අතර එයින් සති තුනකටත් වඩා අඩු කාලයකදී ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම අරඹා ඇත. වෙනත් ක්ෂේත්‍රවල ව්‍යාපෘතීන් ද ඉදිරි දිනවලදී ආරම්භ කෙරෙනු ඇත.

2. මෙම පාලම විසින් මගී ප්‍රවාහනය, අත්‍යවශ්‍ය සේවා සැපයීම සහ ප්‍රදේශයේ ආර්ථික කටයුතු සඳහා වැදගත් වන අත්‍යවශ්‍ය ප්‍රවාහන සම්බන්ධතාවයක් නැවතත් යථා තත්ත්වයට පත් කරන ලදී. අලුතෙන් ස්ථාපනය කරන ලද බේලි පාලම විසින් විශේෂයෙන්ම දුෂ්කර කඳුකර ප්‍රදේශවල සුළි කුණාටුවෙන් පීඩාවට පත් ප්‍රජාවන්ට ප්‍රවාහන කටයුතු පහසු කර ඇත. මෙම ප්‍රතිෂ්ඨාපන කටයුතු ශ්‍රී ලංකා යුධ හමුදාව සහ මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සමීප සම්බන්ධීකරණයකින් යුතුව සිදු කෙරෙනු ලැබේ.

3. මෙම මෙහෙයුමේ කොටසක් ලෙස, C-17 ග්ලෝබ්මාස්ටර් ගුවන්යානා හතරක් මගින් සමස්තයක් වශයෙන් ටොන් 228ක බරකින් යුත් බේලි පාලම් කට්ටල 4ක් ශ්‍රී ලංකාවට රැගෙන එන ලදී. ඒ හා සමඟම ඉන්දීය යුධ හමුදාවේ 48 දෙනෙකුගෙන් සමන්විත ඉංජිනේරු කාර්ය සාධක බලකායක් ද ශ්‍රී ලංකාවට පැමිණියේය. කඩිනමින් මෙම කටයුතු සිදු කිරීම හේතුවෙන් අභියෝගාත්මක භූගෝලීය තත්ත්වයන් සහ අහිතකර

කාලගුණික තත්ත්වයන් හමුවේ පවා ඉක්මනින් ඉංජිනේරු මෙහෙයුම් සිදු කිරීමට අවකාශ සැලසිණ.

4. ඉන්දිය විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මැතිතුමාගේ සංචාරය අතරතුර 2025 දෙසැම්බර් 23 වන දින උතුරු පළාතේ කිලිනොච්චි හි A-35 මාර්ගයේ බේලි පාලම විවෘත කරන ලදි. දිට්වා සුළි කුණාටුවෙන් අනතුරුව ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට ලබා දුන් ආධාර යටතේ ස්ථාපනය කරන ලද ප්‍රථම බේලි පාලම මෙයයි.

5. ඊයේ දින (10) විවෘත කරන ලද පාලමට අමතරව මෙම ස්ථානයට ඉතා නුදුරින් මහනුවර-රාගල මාර්ගයේ 15 වන කිලෝමීටර් කණුව අසල තවත් බේලි පාලමක් ස්ථාපනය කිරීමට නියමිතය. සුළි කුණාටුවේ බලපෑමට ලක්වූ සියලුම ප්‍රදේශවල මාර්ග සම්බන්ධතා පුළුල් ලෙස ප්‍රතිෂ්ඨාපනය කරමින් ඊළඟ අදියරේදී, ඉදිරි සති කිහිපය ඇතුළත තවත් බේලි පාලම් 15ක් ඉදි කෙරෙනු ඇත.

6. අත්‍යවශ්‍ය යටිතල පහසුකම් ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා ඉන්දියාවේ අඛණ්ඩ සහයෝගය තුළින් ශ්‍රී ලංකාවේ ප්‍රතිසාධන සහ පුනරුත්ථාපන ප්‍රයත්නයන්ට සහය වීම සඳහා ඉන්දියාවේ දැඩි කැපවීම අවධාරණය කෙරෙන අතර දෙරට අතර සමීප හවුල්කාරිත්වය සහ අචල මිත්‍රත්වය පිළිබිඹු වේ.

*****

***කොළඹ***
***2026 ජනවාරි 11***